# ආයුර්වේද වෙදකමේ රෝග සුව කිරීම සඳහා බෙහෙත් කූඩැල්ලන් භාවිතා කිරීම

ඩග්ලස් පතිරගේ
විශේෂඥ වෛද්‍ය
ආයුර්වේද මහ රෝහල, රත්නපුර

ලෝකයේ දැනට භාවිතා වන වෛද්‍ය ක්‍රමයන් ගැන සැලකීමේදී ආයුර්වේදයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. වසර 3000 කට වඩා අඛන්ඩ ඉතිහාසයක් ඇති මෙම වෛද්‍ය ක්‍රමය මුලින්ම ඉන්දියාවේ උත්තර භාරතයෙන් ආරම්භ වී පසුව ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ පෙරදිග සහ අපරදිග රටවල් විශාල ප්‍රමාණයකට හඳුන්වා දී ඇත. විශේෂයෙන් උත්තර භාරතයෙන් ලෝකයට හඳුන්වා දී ඇති ශ්‍රේෂ්ඨ දර්ශනයක් වන බුදු දහමත් ආයුර්වේදයත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය නිසාම මෙම දර්ශනයන් දෙකම එම රට වලට පහසුවෙන් හඳුන්වා දීමට හැකි වී තිබේ. කෙසේ වෙතත් මෙම රටවල් බටහිර ආක්‍රමනයට හසුවීමත් සමගම ඉතාමත් දියුණු තත්වයේ පැවති ආයුර්වේද වෙදකම යටපත් කර වසර 600 කටත් වඩා අඩු ඉතිහාසයක් ඇති බටහිර වෙදකමට සම්පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දෙමින් ජනතාව අතර ප්‍රචලිත කර ඇත. මෙහි ප්‍රතිඵලය වූයේ ජනතාව වේගයෙන් බටහිර වෙදකමට හුරු වීමත් අවශ්‍ය අනුග්‍රහය සහ අවධානය නොලැබීම නිසා ආයුර්වේද වෙදකමින් ජනතාව ඈත් වීමත්ය.



කෙසේ වෙතත් බටහිර වෛද්‍ය ක්‍රමය වර්තමානයේ දියුණුවේ උච්චතම අවස්ථාවට පැමිණ ඇතත් ජනතාවගේ සෞඛ්‍ය අභියෝග වලට තනිවම මුහුණ දීමට නොහැකි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව ඇතුළු සමස්ථ ලෝකයේම අතිවිශාල ජනතාවක් විවිධ රෝගාබාධ වලට භාජනය වී දිනපතා බෙහෙත් බුදින කායිකව සහ මානසිකව බෙලහීන පුද්ගලයන්ගේ තත්වයට පත් වී ඇත. මෙයට අමතරව කෘතිම රසායනික ද්‍රව්‍ය අනුසාරෙයන් නිපදවන බටහිර ඖෂධ ස්වාභාවික නිර්මාණයක් වන මිනිසාට ඔරොත්තු නොදීමත් එමගින් ඇතිවන ඉතාමත් හානිකර අතුරු ආබාධ ආදිය නිසා හෙම්බත් වී ඇති රෝගින් (විශේෂයෙන් දියුණු යයි පිළිගෙන ඇති බටහිර රටවල) බටහිර ඖෂධ ක්‍රමයෙන් අත හැර විකල්ප ප්‍රතිකාර කෙරෙහි යොමු වන ප්‍රවනතාවයක් වර්තමානයේ දක්නට ඇත.

මෙම තත්වය අවබෝධ කරගෙන ඇති ලෝක සෞඛ්‍ය සංවිධානය විවිධ රටවලට ආවේනික දේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධනය කර ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ වෙනත් ආධාර හා අනුබල ලබා දීමට පියවර ගෙන ඇත. මෙහිදී ආයුර්වේද වෙදකම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව හා ඉන්දියාව පමණක් නොව විශේෂයෙන් යුරෝපය ඇතුළු බටහිර රටවල ජනතාව වර්තමානයේදී ආයුර්වේද ප්‍රතිකාර සඳහා ශීඝ්‍රයෙන් යොමු වන බව පෙනේ.



ආයුර්වේදය යන්නෙහි සාමාන්‍ය අර්ථය ආයුෂ පිළිබඳ දර්ශනය හෙවත් විද්‍යාව යන්නය.

### ආයුර්වේදය = ආයුර් + වේදය

මෙහි ආයුර් යනු ආයුෂ වන අතර වේදය යනු දර්ශනය හෙවත් විද්‍යාවයි. ආයුර්වේදය යනු බුදු දහම මෙන්ම අංග සම්පූර්ණ දර්ශනයකි. එම නිසා රෝග සහ ඒ සඳහා නියමිත ප්‍රතිකාර වලට අමතරව මිනිසා විසින් එදිනෙදා පවත්වා ගත යුතු ජීවන ක්‍රමය මෙන්ම අධ්‍යාත්මික විමුක්තිය සඳහා අවශ්‍ය උපදෙස් හා උපාය මාර්ගද සවිස්තරාත්මකව දක්වා ඇත.

ආයුර්වේදයේ මූලික සංකල්පයන්ට අනුව මිනිසා ඇතුළු සියළුම ජීවීන් මෙන්ම ස්වාභාවික පරිසරයද නිර්මාණය වී ඇත්තේ පංච මහා භූත යන මූල ද්‍රව්‍ය සහ වාතය, පිත හා කළු යන ත්‍රිදෝෂ මුල් කර ගෙනය. එනිසා මිනිසා සහ පරිසරය අතර ඇත්තේ අන්‍යෝන්‍ය සහ සමීප සම්බන්ධයකි.

මෙම සම්බන්ධතාවය නිසාම ආයුර්වේද වෙදකමේදී රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ඖෂධ වර්ග හා ප්‍රතිකාර ක්‍රම අවට පරිසරයේ ඇති ශාක සතුන් සහ ඛනිජ වර්ග ආදී සම්පත් භාවිතයෙන් නිර්මාණය කර ඇත. මේ නිසා ආයුර්වේද වෛද්‍යවරු පමණක් නොව ප්‍රතිකාර ලබා ගන්නා ජනතාවත් තමා අවට පරිසරයේ ඇති වැදගත්කම ප්‍රායෝගිකව අත් විඳින නිසා පරිසරය සම්පතක් ලෙස සුරැකීමට පුරුදු විය.

ආයුර්වේදය සහ පරිසරය අතර ඇති සම්බන්ධතාවය සලකා බැලීමෙන් අනතුරුව පරිසර සම්පතක් වන බෙහෙත් කූඩැල්ලන් (දිය කූඩැල්ලන්) ප්‍රතිකාර සඳහා භාවිතා කරන ආකාරය දක්වා ඇත.

දිය කූඩැල්ලන් යනු බොහෝ දෙනා දන්නා හඳුනන කුඩා ජලජ සත්වයෙකි. ඇනලීඩා (Analida) කුලයට අයත් හිරුඩො මෙඩිසිනාලිස් (Hirudomedicinali) යන සත්ව විද්‍යාත්මක නාමයෙන් සහ මෙඩිසිනල් ලීච් (Medicinal Leech) ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වන මෙම සත්වයා ආයුර්වේදයේ හඳුන්වන්නේ ජලෞකා ලෙසයි.

දිය කූඩැල්ලන් ඔවුන්ගේ ස්වභාවය අනුව වර්ග දෙකකි.




1. විෂ සහිත වර්ගය (සවිෂ ජලෞකාවන්)
2. විෂ රහිත වර්ගය (නිර්විෂ ජලෞකාවන්)

විෂ සහිත වර්ගය (සවිෂ ජලෞකාවන්)

මෙම සතුන් විශේෂයෙන් ඉතා අපිරිසිදු හා දූෂණය වූ ජලාශයන්හි ජීවත් වන අතර ශරීරය සාපේක්ෂව විශාලය. ශරීර වර්ණය අපැහැදිලි කළු පැහැයෙන් යුක්ත වන අතර පිට පැත්තේ සියුම් රෝම පිහිටා ඇත.

වේගයෙන් චලනය වන මොවුන් ආහාරය සඳහා මාංශ කොටස් ලබා ගනී. මෙම වර්ගයේ සතුන් සපා කෑ විට අධික විෂ සහිතය. විශේෂයෙන් දෂ්ඨ කල ස්ථානයේ අධික ලෙස කැසීම, වේදනාව, ඉදිමීම, රතුවීම, පළු හට ගැනීම, උණ, හිසරදය සහ සමහර විට සිහි මූර්ජා ගතිය වැනි භයානක උපද්‍රව ද ඇති විය හැක. එම නිසා මෙම වර්ගය ප්‍රතිකාර සඳහා යොදා නොගනී.

විෂ රහිත වර්ගය (නිර්විෂ ජලෞකාවන්)

ප්‍රතිකාර සඳහා මෙම සතුන් යොදා ගනී. පිරිසිදු ජලාශ වල වාසය කරයි. සාමාන්‍ය චලනයෙන් යුක්තය. ශරීරය පැහැපත් අතර පිට (පෘෂ්ඨීය) පැත්ත කොළ පැහැයට හුරු දුඹුරු පැහැයෙන් යුක්තය. බඩ (උදරීය) පැත්තෙ ශරීරයට සමාන්තරව ලා දුඹුරු පැහැයට හුරු ඉරි දෙකක් ඇත. මොවුන් බොහෝ දුරට ශාක කොටස් ආහාරයට ගනී.

ප්‍රතිකාර ආරම්භ කිරීමට පෙර කූඩැල්ලන් ඒ සඳහා සූදානම් කරයි. මෙහි අරමුණ පිරිසිදු කර විෂ තව දුරටත් අඩු කර රෝගියාගේ රුධිරය උරා බීමට සුදුසු තත්වයට පත් කිරීමයි. මේ සඳහා පිරිසිදු ජලය සහ කහ මිශ්‍ර ජලය බොහෝ විට භාවිතා කරනු ලැබේ.

මෙම ප්‍රතිකාරයේ දී සිදු කරනුයේ කූඩැල්ලන් මගින් රෝගියාගේ නියමිත ස්ථානයකින් රුධිරය පිටතට ඇද්ද වීමයි. එමගින් බලාපොරොත්තු වන්නේ ස්ථානිකව රැස් වී ඇති අපිරිසිදු රුධිරය බැහැර කිරීමෙන් පසු එම ප්‍රදේශයට පිරිසිදු රුධිරය ගලා වීමට සැලැස්වීමෙන් සහ ස්ථානික සිදුවී ඇති අවරෝධ නැතිකර ජීව සෛලීය ක්‍රියාකාරීත්වය යථා තත්වයට පත් කිරීම මගින් රෝගය සුව කිරීමයි.

ඖෂධ ලබා දීම මගින් සුව කිරීමට අපහසු රෝග සහ ශල්‍ය කර්ම මගින් සුව කිරීමට නියමිත රෝග රාශියක් මෙම ප්‍රතිකාර ක්‍රමය මගින් පහසුවෙන් සුව කිරීමට හැකියාව ඇත. එසේම ශල්‍ය කර්ම මගින් සුව කිරීමට අපහසු සමහර රෝග කූඩැල්ලන් ඇල්ලීමේ ප්‍රතිකාර මගින් පහසුවෙන් සුව කිරීමට හැකියාව ඇත.



ආයුර්වේදයේ ශල්‍ය ප්‍රතිකාර යටතට ගැනෙන මෙම ප්‍රතිකාර ක්‍රමය අවම පිරිවැයකින් කළ හැකි වීමත් කුඩා වයසේ සිට වැඩිහිටි දක්වා ඕනෑම වයසක අයෙකුට භාවිතා කල හැකි වීම සහ හානිකර අතුරු ආබාධ වලින් තොර වීම යනාදි හිතකර සාධක නිසා මෙය විශිෂ්ඨ ප්‍රතිකාර ක්‍රමයක් ලෙස වෛද්‍ය ග්‍රන්ථවල දක්වා ඇත.

පාදවල නහර ගැට ගැසීම (Varicose vein), සුව කිරීමට අපහසු පැරණි තුවාල (Chronic ulcer), සන්ධි ආශ්‍රිත රෝග (Joint disorder), චර්ම රෝග (Skin disease), අක්ෂි රෝග (Eye diseases), ශීර්ෂ රෝග (Head disorder) සහ මුහුණේ ඇති වන කුරුලෑ (Pimples and abnormal colour) ඇතුළු රෝග රාශියක් මෙම ප්‍රතිකාර ක්‍රමය මගින් පහසුවෙන් සුව කිරීමේ හැකියාව ඇත.

ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍යවරුන් විසින් මෙම ප්‍රතිකාරය අතීතයේ දී ඉතා සාර්ථකව සිදුකර ඇතත් වර්ථමානයේ දී යම් අඩපණ වීමක් දක්නට ඇත. ජනතාව අතර තිබෙන අනවබෝධය සහ බිය, රසායනික පොහොර සහ කෘමි නාශක බෙහෙත් ආදියෙන් සිදු වන පරිසර දූෂණය නිසා සුදුසු දිය කූඩැල්ලන් සොයා ගැනීමට ඇති අතිදුෂ්කරතාවය යනාදි හේතු නිසා මෙම ප්‍රතිකාර ක්‍රමය සිදු කිරීම පිළිබඳව වර්තමානයේ දේශීය වෛද්‍ය වරුන්ගේ අවධානය අඩු වී ඇත. එහෙත් ඉන්දියාව, රුසියාව සහ ජර්මනිය වැනි රටවල බෙහෙත් කූඩැල්ලන් බෝ කිරීම සඳහා සහ ඔවුන් සිටින පරිසරයන් ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇති අතර ප්‍රතිකාර සඳහා අවශ්‍ය කූඩැල්ලන්ද විවෘත වෙළඳ පොළේ ඇති ෆාමසි වලින් පහසුවෙන් මිලදී ගැනීමට හැකිය. එම නිසා එම රටවල මෙම ප්‍රතිකාර ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන බව සඳහන් කල හැකිය.

## - සොඳුරු රැයක හමු වූ සොබා -

ගත සිත වෙහෙස වී
වැඩ අතර සිර වී
සිටින සඳ මෙපුරයේ
ලැබුණු ඉසිබුවක දී
ගියෙමි රුහුණේ සොඳුරු වූ ඒ
මා දිනූ ගම් බිම වෙතටැ.

එකල මිතුරන් හමු වී - සිහි කළෙමු පෙර සත්කම්
ගියෙමි ගුරු මිතුරෙකුගෙ - නිවසෙ වූ මහ පොත් ගුලක් වෙතැ
එළු සකු මගධ පොත් අතර - දුටිමි එක් පොතක් සුහුරු වූ
කිමෙක් දැයි මා බැලූ සඳ - හැඳින ගත්තෙමි එය "සොබා" විය

සකි සඳකගෙන් ලැබුණු ඒ පොත - නිසා දහසක් දනන් කැල වෙතැ
සොබා දහමේ රුසිරු ගුණයත් - රැකිය යුතු පරිසරේ විකුමත්
තව තවත් බොහො බොහෝ කරුණුත් - පුදන්නට රුකුලක් මැවූ බව
පැවසුවා ඔහු සොම්නසින්

ඈත නිසසල ගම් බිමක - සොඳුරු වූ සඳකැන් රැයක
සීත මඳ නළ සුවය විඳගෙන - කතා කළෙ පරිසරය අසිරිය

මා රැඳෙන ඇමතිහල වෙතින් - පුද දෙන "සොබා" මිණි පහනින්
අලු කළ හැකි නම් දනන් මන - එය මැ ඇත මා පොබයලන්නට

"සොබා" හට සබැඳි වත
සියලු සත් දනන් වෙතැ
පතන්නෙමි මගේ සුපැතුම්
තිමිරය එකලු කරනට

- මයන්ත මුතුකුමාරණ -

